# යෙහෙළිය



## හේමමාලා හේරත්

ඇය තනිවම සෙල්ලම් කරමින් සිටි සිය දියණිය දෙස නිහඬව බලා උන්නාය. දැරිය සාලයේ මුල්ලකවූ තම සෙල්ලම් බඩු එකිනෙක තෝරා පසෙකින් තැබුවාය. ඇය වරින් වර ඒවා යමෙකුහට දෙන අයුරුත්, නැවත ඒවා තමන් වෙත ගන්නාක් මෙන් ක්‍රියා කරන අයුරුත්, අතින් කට වසාගෙන, ලොකු එකියක මෙන් හිනාවෙන අයුරුත් දුටු නලිනීටද සිනා පහල වූයේ නිතැතින්මන්ය.

දියණිය මෙසේ මවා ගත් යෙහෙළියක සෙල්ලම් කලේ අද ඊයෙක නොවේ. හිටි හැටියේ ඇයට මෙවන් යාලුවෝ වෙති. වරෙක ඔවුන් සුරතල් සතුන්ය. වරෙක මාමලා සහ නැන්දලාය. ඈ කන්නේ , බොන්නේත් නිදන්නේත් ඔවුන් සමගිනි. එමෙන්ම නොදන්වා පැමිණෙන්නාක් මෙන්ම, ඔවුහු හිටි හැටියේ අතුරුදහන් වෙති.

"අද බන්ටිට අලුත් යාලුවෙක් හම්බවෙලා" එදා රෑ කෑම කන අතර සිය සැමියා හා පැවසුවාය. තිසර, මේසයේ හතරවෙනියකු සඳහා සකසා තිබූ ස්ථානය දුටුවේ එවිටය. එහි වූයේ බන්ටීගේම පිඟානක්, හා කෝප්පයකි.
නලිනී කෑම බෙදුවාය. "ඇයි" ඈ දියණියගෙන් විමසුවේ ඇය තාමට එහායින්වූ පිඟාන අතින් වැසූ නිසාය.

"එයාට බඩගිනි නෑලු. කෑම එපා කියනවා"
"ඒ මොකද? එයා රෑට කාලද ඇවිල්ල ඉන්නේ" තිසර විමසුවේය.

"නෑ. නෑ. එයාට දුකයිලු"

නලිනී හා තිසර එකිනෙකා දෙස බැලුවෝය. " දුකයිලු?" ඔවුන් දෙදෙනාම ප්‍රශ්න කලේ එක විටය.
"ඔව්" බන්ටී කණගාටුවෙන් පැවසුවාය. "ගෙදර දාලා ආව හන්දා එයා දුකෙන් ඉන්නේ"

"ඉතින් එහෙමනම් අපි එයාට ඉක්මනින් කෑම දීලා ගෙදර යවමු" නලිනී පැවසුවාය. බන්ටී කිසිත් නොකියා හිස දේපසට සැලුවාය. "එයාට එහේ යන්ට බෑ. හරි දුරයි."

බන්ටී ඇඳට ගියේ ඒ යාලුවාද සමගිනි. රාත්‍රී කිරි වීදුරුව බොන අවස්ථාවේදීද, ඇය එය තම යෙහෙලිය වෙත දිග කරනුද, හිස සොලවමින් මොනවාදෝ කියන අයුරුද, ඉන්පසු තනිවම කිරි වීදුව පානය කොට නිදන්ට සැරසෙන අයුරුද නලිනී කුතුහලයෙන් බලා උන්නාය. ඈ ඇඳ පසෙකට වූයේ යෙහෙලියට ඉඩ දීම සඳහාය.

"බට්ටිට ඉඩ ඇතිද?" කාමරයෙන් පිටව යන නලිනීට ඇය පවසනු ඇසුනි.

"කෝ යාලුවෝ දෙන්නා නිදිද?" යහන්ට ගිය ඇයගෙන් තිසර ඇසීය. නලිනී සිහින් සිනාවක් පෑවාය. "මේ ළමයගේ මේ සෙල්ලම ලොකු වෙනකල්ම තියෙයිද දන්නේ නෑ."
"පිස්සුද ඉස්කෝලේ යන්න පටන් අරන් යාලුවෝ මුන ගැහිච්ච හැටියේ ඔය ඔක්කොම නවතීවි"
විදුලි පහන නිවා දැමූ නලිනී යහනේ දිග ඇදුනාය. තමාට නින්ද ගියේ කීයටදැයි ඇයට මතකයක් නොවීය.

ඇය උන්නේ සිහිනයක බවක් ඈ මුලින් නොදැන සිටියාය.

ඈ දිවගියේ මඩ වගුරු රැසක් පසු කරමිනි. සීත සුළඟක් හමා එනුද, තමාගේ කන් ඉන් පිරී යනුද ඇයට දැනුනේය. කුණාටුවක් අත ලඟ එතැයි ඈ සිතුවාය. මුහුදු වෙරල ගොඩබිම වෙතට ඇදී, එහි වැදී, ආපසු යන හඬද ඇයට ඇසිනි. කරුවල නිසා කිසිවක් පෙනුනේ නැති මුත් අහසේ කොනක දුබල හඳක් විය. මෙතරම් කලුවරක් ඇත්තේ අහස වැහි වලාවෙන් වැසී තිබූ නිසා වත්ද?

ඇය ගරා වැටුනු ගොඩනැගිල්ලක් තුලින් දිව ගියාය. එය පැරණි දෙව් මැදුරක් බව ඇගේ සිත පැවසීය. ඉන් එලියට බට ඇය දුටුවේ සඳ එලියෙන්, ඉතා අසරණ විලාශයක් මවා පෑ සොහොන් කොත් කිහිපයකි. ඉන් එක් මුල්ලකවූ, කුඩා සොහොන් කොතක් ඉදිරියේ බන්ටී දණ ගසාගෙන උන්නාය. ඇය උන්නේ යමක් මුමුණමිනි.

නලිනී නින්දෙන් නැගිට්ටේ හඬක් නගමිනි. ඇගේ ශබ්දය අසා තිසරද අවදි වූයේය."ඇයි නලිනි..." ඔහු ඇසූ මුත් ඇයට ඊට දිය හැකි පිලිතුරක් නොවීය. "මම මහා අමුතු හීනයක් දැක්කා. බන්ටි ගැන"

දෙදෙනාම ඔවුන්ගේ කාමරයට යාබදවූ දැරියගේ කාමරය වෙත නිහඬව ගමන් කලෝය. රාත්‍රියට දැල්වෙන විදුලි එලියෙන් දැරිය දුට නලිනී පහසුවෙන් හුස්ම ගත්තාය.බොහෝ වේලාවක් යනතුරු , නලිනිට නින්දක් නාවේය. ඇය කල්පනා කලේ සිහිනයේ තේරුම ගැනය. පසුවදා අවදිවූ විට ඇයට දැනුනේ බලවත් වෙහෙසකි. තිසර පුරුදු පරිදි වැඩට ගියේය. දැරිය පුරුදු පරිදි සෙල්ලමට වැටුනාය.

දුර ඇමතුම ලැබුනේ නලිනී සිහිනය අමතක කොට දහවල් කෑම පිලියෙල කරද්දීය."මද්දුම අක්කේ මම චූටි. " කතා කලේ නංගීය.

"චූටි පොඩ්ඩක් ඉන්ඩ මම මේ ලිප වහනකල්"
ඈ ලිප නිවා දමා සාලයට පැමිණ අසුන් ගත්තාය.
"අක්කේ අනේ හරි වැඩක් වෙලානේ . ඔයාට මතකද ශීලා. අර ඔයාගේ පන්තියේ හිටියේ"
"ඔව්. ඔව්...ඉතින්"

"එයාලගේ චූටි දුවෙක් හිටියා මතකද?"
"ඔව් අනේ ඇයි ඒ ළමයට මොනවා වෙලාද? ගිය නිවාඩුවට ආපු වෙලාවේ මෙ බන්ටි එක්ක සෙල්ලම් කලේ" නලිනීගේ ඇඟ පුර හිරිගඩු පිපුනේ ඇය එසේ පවසනවාත් සමගය.
"අනේ එයා මේ ලඟදි නැති උනානේ ගෙදර අයත් එක්ක මූදේ පීනන්ට ගිය වෙලාවක්"
නලිනී අතවූ, දුර කතනය බිම වැටෙන හඬ ඇසුනු දැරිය අම්මා දෙස බැලුවාය.

"බන්ටී...බන්ටී" නලිනී කෑගෑවේ ඇයිදැයි දැරියට තේරුනේ නැත.
"බන්ටී..." අම්මා තමාව දැඩිව වැළඳ ගත්තෙන් දැරිය මඳ හඬක් නැගුවාය.

"ඌයි. මට රිදෙනවා..."
"කෝ ඔයාගේ යාලුවා?"
"බට්ටී"
නලිනී ඔලුව සෙලවූවාය."එයා ගියා අම්මා."

නලිනී දෑස් පියාගත්තී, දිග හුස්මක් හෙලූවාය.

*(සත්‍ය සිදුවීමක් ඇසුරෙනි. )*




